# පාඩම: දිශා



## ක්‍රියාකාරකම - 01

1. පෙරවරු 8.00 ට එළිමහනට යන්න.

2. ඉර පායා ඇති දිශාවට හැරෙන්න. (කෙලින්ම ඉර දෙස නොබලන්න.)

3. ඔබ මුහුණලා සිටින්නේ ඉර නැග එන දිශාවටයි.

4. එම දිශාව හඳුන්වන නම කුමක්ද? ............................................................

5. ඔබ පිටුපා සිටින දිශාවෙන් ඉර බැසයයි.

6. එම දිශාව හඳුන්වන නම කුමක්ද? ..............................................................

7. දැන් ඔබේ දැත් දෙපසට දිගු කරන්න.

8. දකුණු අත ඇත්තේ කුමන දිශාවේද?.........................................................

9. වම් අත ඇත්තේ කුමන දිශාවේ ද? ............................................................

10. බස්නාහිර දිශාවට විරුද්ධ දිශාව කුමක්ද?..............................................

11. දකුණු දිශාවට විරුද්ධ දිශාව කුමක් ද?...................................................

## ක්‍රියාකාරකම - 02

| | | | |
|---|---|---|---|
| බස්නාහිර | දකුණ | උතුර | නැගෙනහිර |
| ඊසාන | ගිනිකොන | වයඹ | නිරිත |

1. ඝන කඩදාසිවලින් මෙවැනි කාඩ්පත් සකස් කර ගන්න.

2. පෙරවරු 8.00 ට හොඳින් ඉර එළිය වැටී ඇති ස්ථානයකට යන්න.


3. ඉර පායා එන දිශාවට මුහුණලා සිට ගන්න. (කෙලින්ම ඉර දෙස නොබලන්න.)

4. ඔබ සිටගෙන සිටින ස්ථානයේ සිට මීටර එකක් ඉදිරියෙන් **නැගෙනහිර** ලෙස ලියා ඇති කාඩ් පත තබන්න. ඔබ පිටුපා  සිටින දිශාව හඳුනාගන්න.

5. ඔබ සිටින ස්ථානයේ සිට මීටර එකක් පිටුපසින් **බස්නාහිර** ලෙස ලියා ඇති කාඩ්පත තබන්න.

6. ඔබ සිටින ස්ථානයේ සිට මීටර එකක් දකුණු අත පැත්තේ **දකුණ** ලෙස ලියා ඇති කාඩ්පත ද

7. වම් අත පැත්තෙන් මීටර එකක් දුරින් **උතුර** ලෙස ලියා ඇති කාඩ්පත ද තබන්න. දැන් එම දිශා පහත පරිදි යා කරන්න.





8. දැන් උතුර හා නැගෙනහිර දිශා අතර ඊසාන කාඩ්පත ද,

නැගෙනහිර හා දකුණ අතර ගිනිකොණ  කාඩ්පත ද,

දකුණ හා බටහිර අතර නිරිත කාඩ්පත ද,

බස්නාහිර හා උතුර අතර වයඹ යන කාඩ්පත ද තබන්න.

(ඒවා ද යා කරන්න.)




මෙම දිශා අට පිළිවෙළින් මතක තබා ගැනීම සඳහා පහත ගීතය තාලයකට ගායනා කරන්න.


**උ**පුල් **ඊ**ළඟ **නැ**වෙන් **ගි**හින් **ද**මමි **නි**දිද **බ**ලා **ව**රෙන්

| | | | |
|---|---|---|---|
| උ - උතුර | ඊ - ඊසාන | නැ - නැගෙනහිර | ගි - ගිනිකොන |
| ද - දකුණ | නි - නිරිත | බ - බස්නාහිර | ව - වයඹ |


**ප්‍රධාන දිශා**




**අනු දිශා**



# ක්‍රියාකාරකම - 03




**ඉහත සටහන ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. බෝලය ඇත්තේ නිවසට .............................................. දිශාවෙනි.

2. පොල් ගස නිවසට .........................................දිශාවෙන් පිහිටා ඇත.


3. ගේට්ටුව ඇත්තේ නිවසට කුමන දිශාවෙන්ද? ......................................

4. ළිඳට දකුණු දිසාවෙන් සිටින්නේ කවු ද? .............................................

5. පොල් ගසට උතුරින් ඇතින්ම ඇත්තේ කුමක්ද? .................................

## ක්‍රියාකාරකම - 03

විනෝදයට ක්‍රීඩාවක්






| වාර ගණන | ලැබුණු දිශාව |
|---|---|
| 1 වාරය | |
| 2 වාරය | |
| 3 වාරය | |
| 4 වාරය | |
| 5 වාරය | |
| 6 වාරය | |
| 7 වාරය | |
| 8 වාරය | |
| 9 වාරය | |
| 10 වාරය | |

දැන් හැට්ට කටුව රවුම මැද රඳවා ගන්න. හැට්ට කටුවේ අගට ඇඟිල්ලෙන් වේගයෙන් ගසන්න. හැට්ට කටුව නතර වූ ස්ථානයේ දිශාවක් තිබේ නම් එම දිශාව ලියන්න. දිශාවක නතර නොවූයේ නම් ඉරක් අඳින්න. මෙම ක්‍රීඩාව දිගටම කරගෙන යන්න.

## ක්‍රියාකාරකම - 04

5 ශ්‍රේණිය ගණිතය පෙළ පොතේ 117, 118, 119, 120 පිටුවල ඇති අභ්‍යාස කරන්න.

# පාඩම:රෝම සංඛ්‍යාංක



## ක්‍රියාකාරකම - 01

(1).5 ශ්‍රේණිය ගණිතයපෙළ පොත අතට ගන්න.

(2). එහි පළමු වන පිටුවේ සිට ඉදිරියට දොළහ තෙක් රෝම ඉලක්කමෙන් ලියා ඇති පිටු අංකඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

(3). දැන් එම රෝම සංඛ්‍යාවලට අදාළ හින්දු අරාබි ඉලක්කම් ඉදිරියෙන් ලියන්න.

(4). අංක i රෝම ඉලක්කමෙන් ලියා නැත. එය ඔබට ලිවිය හැකි ය.

## ක්‍රියාකාරකම - 02

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| i | ii | iii | iv | v | vi | vii | viii | ix | x |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |

1.ඉහත ආකාරයට සංඛ්‍යා කාඩ්පත් සකස් කර ගන්න.

2. ඒවා මිශ්‍ර කරන්න.

3. දැන් ඒ සියල්ල ම පෙට්ටියක් තුළට දමන්න.

4. පෙට්ටිය දෙස නොබලා එක් කාඩ්පතක් අතට ගන්න.

5. කාඩ් පතේ ඇති සංඛ්‍යාවට අදාළ රෝම සංඛ්‍යාව හෝ හින්දු අරාබි ඉලක්කම තෝරන්න.

**ඔබට පහත පරිදි සංඛ්‍යා ලැබෙනු ඇති.**

| | |
|---|---|
| 4 | iv |
| x | 10 |

# ක්‍රියාකාරකම - 03

1. සමාන දිගකින් යුතු ඉරටු හෝ බීම බට අසූවක් සපයා ගන්න.

(මේ සඳහා ගිනිකූරු වුවද යොදා ගත හැකි ය.)

2. ඔබ සපයා ගත් ද්‍රව්‍යවලින් පහත සඳහන් රෝම සංඛ්‍යා සාදන්න.

**v** **iv** **x** **ix**

| |
|---|
| **v යන සංඛ්‍යාවේ ඔබේ වම් අත පැත්තෙන් i තැබූවිට සැදී ඇත්තේ iv යන සංඛ්‍යාවයි.** |
| **X යන සංඛ්‍යාවේ ඔබේ වම් අත පැත්තෙන් i තැබූ විට ix සංඛ්‍යාව සැදී ඇත.** |
| **මින් පැහැදිලි වන්නේ වම් අත පැත්තෙන් තබන සංඛ්‍යාව මුලින් ඇති සංඛ්‍යාවෙන් අඩු වන බවයි.** |

**v** **vi** **x** **xi**

| |
|---|
| **v යන සංඛ්‍යාවේ ඔබේ දකුණු අත පැත්තෙන් i තැබූවිට සැදී ඇත්තේ vi යන සංඛ්‍යාවයි.** |
| **X යන සංඛ්‍යාවේ ඔබේ දකුණු අත පැත්තෙන් i තැබූ විට xi සංඛ්‍යාව සැදී ඇත.** |
| **මින් පැහැදිලි වන්නේ දකුණු අත පැත්තෙන් තබන සංඛ්‍යාවමුලින් ඇති සංඛ්‍යාවට එකතු වන බවයි.** |

දැන් මෙම හින්දු අරාබි ඉලක්කම්වලට අදාළ රෝම සංඛ්‍යා ඔබ සපයා ගත් ද්‍රව්‍යවලින් සාදන්න.

| | | |
|---|---|---|
| 12 - ................. | 16 -................. | 20 - ................. |
| 13 - ................. | 17 - ................. | 15 - ................. |
| 14 - ................. | 18 - ................. | 19 - ................. |

## ක්‍රියාකාරකම - 04


ඔබ සෑදූ රෝම සංඛ්‍යා දෙස බලා පහත වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | අවශ්‍ය ගිනිකූරු / ඉරටු කූරු ගණන |
|---|---|
| i | |
| ii | |
| iii | **3** |
| iv | |
| v | |
| vi | |
| vii | |
| viii | **5** |
| ix | |
| x | |
| xi | |
| xii | |
| xiii | |
| xiv | |
| xv | |
| xvi | |
| xvii | |
| xvii | |
| xix | |
| xx | **4** |

## ක්‍රියාකාරකම - 05

5 ශ්‍රේණිය ගණිතය පෙළ පොතේ 136, 137 පිටුවල අභ්‍යාස කරන්න.

# පාඩම:පරිමාව හා ධාරිතාව



## ක්‍රියාකාරකම - 01

1. ජලය $1l\,500ml$ මැනගත හැකි විනිවිද පෙනෙන භාජනයක් සපයාගන්න. එහි පරිමාණ සටහන් කර තිබිය යුතුයි.

2. ජලය $5l$ ප්‍රමාණයක් මැන ගත හැකි භාජනයක් සපයාගන්න. එහිපරිමාණ සටහන් කර තිබීම අවශ්‍ය නොවේ.

3. දැන් ජලය $1l\,250ml$ ක් මැන ගන්න. එය විශාල භාජනයට දමන්න.

4. නැවතත් ජලය $1\,l\,250ml$ ක් මැන ගන්න. එය ද විශාල භාජනයට දමන්න.

5. තවත් වරක් ජලය $1l\,250ml$ ක් මැන ගන්න. එය ද විශාල භාජනයට දමන්න.

දැන් විශාල භාජනයේ ඇති ජලය ප්‍රමාණය කොපමණ ද?

**අපි එය සොයා බලමු.**


**එක් ක්‍රමයක්,**

**$1l\,250ml + 1l\,250ml + 1l\,250ml$ = ..........................**

**තවත් ක්‍රමයක්,**

$$\begin{array}{r} 1l\,250ml \\ \times\quad 3 \\ \hline \\ \hline\hline \end{array}$$

කුඩා භාජන හතරෙහි ම ඇති ජලය විශාල භාජනයට දැමුවේ නම් එහි ඇති මුළු ජලය ප්‍රමාණය කොපමණ ද? ගුණ කර පිළිතුර ලබා ගන්න.




2*l* 150*ml*

x 4

---

## ක්‍රියාකාරකම - 02

ක්‍රියාකාරකම 1හි යොදාගත් පරිමාණ සටහන් කරන ලද භාජනයට

ජලය 600*ml* පුරවන්න. එය 5*l*ක් පිරවිය හැකි භාජනයට දමන්න.

නැවත වතාවක් ජලය 600*ml* පුරවාගන්න. එයද විශාල භාජනයට දමන්න.

නැවතත් ජලය 600*ml* පුරවා ගන්න. එය ද විශාල භාජනයට දමන්න.

නැවත වතාවක් ජලය 600*ml* පුරවා එය විශාල භාජනයට දමන්න.

දැන් විශාල භාජනයේ ඇති ජලය ප්‍රමාණය කොපමණ ද?

**අපි එය මෙසේ සොයමු.**

| $1l = 1\ 000\ ml$ |
|---|

**600*ml***


**x 4**

→

| 2 400*ml* |
|---|

| *l* | *ml* |
|---|---|
| 2 | 400 |

## ක්‍රියාකාරකම - 03





1. පරිමාණ සටහන් කරන ලද ඉහත භාජන සපයා ගන්න.

2. විශාල භාජනයට ජලය 10*l* දමන්න.

3. දැන් එම ජලය කුඩා භාජනවලට 2*l* බැගින් දමන්න.


4. භාජන කීයකට දැමුවේ ද? .........................................

**මෙහි පිළිතුර ලබා ගැනීමට පහසු ක්‍රමයක් හඳුනා ගනිමු.**




**ඉහත සිදුකළ ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නයට පිළිතුරු සොයමු.**

ජලය 10*l* සමාන ව භාජන පහකට දැමුවේ නම් එක් භාජනයක ඇති ජලය ප්‍රමාණය කොපමණ ද? ............................




## ක්‍රියාකාරකම - 04

**0**5 ශ්‍රේණිය ගණිතය පෙළ පොතේ 130, 131, 132 පිටුවල අභ්‍යාස කරන්න.

# පාඩම: බර මැනීම


SF-400A
278
LIGHT
PCS
ON/OFF
MODE
TARE
Electronic Compact Scale
0.000

# ක්‍රියාකාරකම - 01

1. සමාන බරකින් යුතු මෙවැනි හිස් සැමන් ටින් දෙකක් සපයාගන්න.

2. එකක බර 425g කි.

3. දැන් එම සැමන් ටින් දෙකෙහිම ඇති බර සොයමු.

425g + 425g = .........................




425g

x 2

[ ]

1. රෙදි සෝදන මෙවැනි සබන් කැටතුනක් සපයාගන්න.

2. සබන් කැට තුනේ ම ඇති බර සොයමු.

115g+ 115g+ 115g = ...................




115g

x 3

[ ]

# ක්‍රියාකාරකම - 02



1. එක් සහල්ගෝනියක බර **15kg 550g**කි. මෙම සහල් ගෝනිවල මුලු බර සොයමු.

```
  15kg  550g
x          3
____________

============
```

2. එකක බර 32 kg 250gක් වන පිටි ගෝනි දෙකක මුලු බර සොයමු.

```
  32 kg  250g
x          2
____________

============
```

3. 35 kg 450g

```
  35 kg  450g
x          3
____________

============
```

## ක්‍රියාකාරකම - 03

1. බර සමාන මලු දෙකක මුලු බර 8 kg 422g ක් නම් එක් මල්ලක බර කොපමණ ද?

```
       4 kg   211g
     ___________
  2 | 8 kg   422g
    | 8
    |__________
    | 0      422g
              4
             ___
              02
               2
             ___
              02
               2
             ___
               0
```

පිළිතුර = 4 kg 211g

**2. අපි මෙම ගැටලුව විසඳමු.**

පාර්සල දෙකක මුලු බර 18kg 500gක් නම් එක් පාර්සලයක බර කීය ද?

........18kg 500g


**ගණිතය පෙළ පොතේ 133, 134, 135 පිටුවල අභ්‍යාස කරන්න.**

# පාඩම:ගැටලු විසඳීම




# ක්‍රියාකාරකම - 01

1. i ii iii රූප A4 කඩදාසියක ඇඳගන්න.ගුණන වගුව දෙස බලා එහි ක්‍රියාකාරකම් සිදුකරන්න.




ii

| × | 8 | 10 |
|---|---|---|
| 2 | | |
| 4 | | |
| 7 | | |
| 9 | | |




ගුණන වගුව

| × | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 2 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 | 20 |
| 3 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 | 30 |
| 4 | 4 | 8 | 12 | 16 | 20 | 24 | 28 | 32 | 36 | 40 |
| 5 | 5 | 10 | 15 | 20 | 25 | 30 | 35 | 40 | 45 | 50 |
| 6 | 6 | 12 | 18 | 24 | 30 | 36 | 42 | 48 | 54 | 60 |
| 7 | 7 | 14 | 21 | 28 | 35 | 42 | 49 | 56 | 63 | 70 |
| 8 | 8 | 16 | 24 | 32 | 40 | 48 | 56 | 64 | 72 | 80 |
| 9 | 9 | 18 | 27 | 36 | 45 | 54 | 63 | 72 | 81 | 90 |
| 10 | 10 | 20 | 30 | 40 | 50 | 60 | 70 | 80 | 90 | 100 |

2. පැන්සල් දුසිම් හයක ඇති මුලු පැන්සල් ගණන කීය ද?

(දුසිමක ඇතිපැන්සල් ගණන 12)

පිළිතුර මෙසේ සොයමු.

$$\begin{array}{r} 12 \\ \times\ 6 \\ \hline \square \end{array}$$

3. පැකට්ටුවක තලකැරලි 8 බැගින් පැකට්ටු 226 ක ඇති තල කැරලි ගණන කීය ද?

$$\begin{array}{r} 226 \\ \times\ 8 \\ \hline \square \end{array}$$

4. A 142km B ? C

B සහ Cඅතර දුර A සහ Bඅතර දුර මෙන් හත් ගුණයකි. B සහ Cඅතර දුර කීය ද? ..................

5. එක් දුම්රියක මගීන් 367සිටිති. එවැනි දුම්රියහතක සිටින මගීන් ගණන කීය ද? .........................

## ක්‍රියාකාරකම - 02

1. ජලය 20 *l*ක් ගෙන 2 *l*බැගින් කුඩා භාජනවලට දමන්න.

භාජන කීයකට දැමිය හැකිදැයි බලන්න. ..............................

2.පිට්ටනියක්වටාරණතුංග වට දෙකක් දුවන ලදී. ඔහු දුවන ලද මුලු දුර

950 m කි. සුසන්තිකා එමපිට්ටනිය වටා එක් වටයක් දුවන ලදී. ඇය දුවන

ලදමුලු දුර සොයමු. .................m

3. පාසලක සිටින මුලු සිසුන් ගණන 963 කි. ඔවුන්ක්‍රීඩා උත්සවයක් සඳහා

සමානව නිවාස තුනකට බෙදන ලදී. එක් නිවාසයක සිටින සිසුන් ගණන

සොයමු. ...............................................

## ක්‍රියාකාරකම - 02

**5 ශ්‍රේණිය ගණිතය පෙළ පොතේ 152, 153, 154 යන පිටුවල ඇති අභ්‍යාස කරන්න.**